සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය
நலன்புரி நன்மைகள் சபை
WELFARE BENEFITS BOARD
මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
Ministry of Finance, Economic Stabilaization & National Policies
මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

මගේ අංකය / எனது இல / My No. MF/WBB/02/05/01/05 | ඔබේ අංකය / உமது இல / Your No | දිනය / திகதி / Date 2024.03.12

WBB/Circular/No-07/2024

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්/ අතිරේක සුභසාධක ප්‍රතිලාභ කොමසාරිස්වරුන් සහ
සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්/නියෝජ්‍ය සුභසාධක ප්‍රතිලාභ කොමසාරිස්වරුන් වෙත,

## සුභසාධක ප්‍රතිලාභ පනත යටතේ පුද්ගලයින් විසින් අසත්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ක්‍රියා කිරීම

යම් පුද්ගලයකු විසින් 2002 අංක 24 දරණ සුභසාධක ප්‍රතිලාභ පනතේ 7 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ ලබා දෙනු ලබන ප්‍රකාශනයක හෝ 7 වන වගන්තියේ (1) වන උපවගන්තිය ප්‍රකාරව සපයනු ලබන තොරතුරු සම්පූර්ණයෙන්ම හෝ කොටසක් අසත්‍ය බවට අනාවරනය වුවහොත් ඒ සම්බන්ධයෙන් එම පනතේ 14 වගන්තිය ප්‍රකාරව ගතයුතු පියවර සම්බන්ධයෙන් පහත උපදෙස් නිකුත් කරමි.

01. මේ අනුව සුභසාධක ප්‍රතිලාභ අපේක්ෂාවෙන් මූලික අයදුම්පතක් ඉදිරිපත් කිරීමේදී හෝ එම අයදුම්පත්වලට අදාලව සංගණනය කිරීමේදී හෝ යම් අයදුම්කරුවකු විසින් අසත්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බවට යම් තොරතුරක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලැබුනහොත් හෝ එම කාර්යාල මඟින් සිදුකරනු ලබන යම් සොයාබැලීමක ප්‍රතිඵලයක් වශයෙන් අනාවරණය වුවහොත් ඒ සම්බන්ධයෙන් අදාල දිස්ත්‍රික් ලේකම්/අතිරේක සුභසාධක ප්‍රතිලාභ කොමසාරිස්ගේ අවධානයට එම කරුණ යොමු කළ යුතුයි.

02. අදාල දිස්ත්‍රික් ලේකම්/ අතිරේක සුභසාධක ප්‍රතිලාභ කොමසාරිස් විසින් එම තොරතුරු සම්බන්ධයෙන් යම් නිලධාරියකු හෝ නිලධාරී කණ්ඩායමක් යොදවා පරීක්ෂණයක් සිදු කල යුටුතුයි. එම පරීක්ෂණ මඟින් පහත සඳහන් කරුණු පිළිබඳව අනාවරණය කර ගත යුතුයි.

I. අදාල තැනැත්තා විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු අසත්‍ය තොරතුරු ද යන්න.

II. එම තොරතුරු එම තැනැත්තා විසින්ම හිතාමතාම ඉදිරිපත් කර තිබේද යන්න.
එම පරීක්ෂණයේදී අදාල කරගත් ලිඛිත ප්‍රකාශ, සටහන්, නිර්දේශ, සහායක ලියවිලි ආදිය ඇතුලත් වාර්තා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තබාගත යුතුයි.

III. එම පරීක්ෂණයේ ප්‍රතිඵල මත දිස්ත්‍රික් ලේකම්/අතිරේක සුභසාධක ප්‍රතිලාභ කොමසාරිස් විසින් සිය නිර්දේශ සහිතව වාර්තාවක් මා වෙත එවිය යුතුයි. එම වාර්තාවේ පහත සඳහන් කරුණුද අඩංගු කළ යුතුයි.

- අදාල තැනැත්තා/පවුල යම් ප්‍රතිලාභයක් සඳහා තෝරා ගෙන තිබේ නම් එම ප්‍රතිලාභ කාණ්ඩය හා HH අංකය.
- සපයා ඇති අසත්‍ය තොරතුරු පිළිබඳ විස්තර.
- දිස්ත්‍රික් ලේකම්/ අතිරේක සුභසාධක ප්‍රතිලාභ කොමසාරිස්ගේ නිර්දේශය.



Scanned with CamScanner

සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය
நலன்புரி நன்மைகள் சபை
WELFARE BENEFITS BOARD
මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
Ministry of Finance, Economic Stabilaization & National Policies
මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No. | MF/WBB/02/05/01/05 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2024.03.12 |

WBB/Circular/No-07/2024

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්/ අතිරේක සුභසාධක ප්‍රතිලාභ කොමසාරිස්වරුන් සහ
සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්/නියෝජ්‍ය සුභසාධක ප්‍රතිලාභ කොමසාරිස්වරුන් වෙත,

**සුභසාධක ප්‍රතිලාභ පනත යටතේ පුද්ගලයින් විසින්**
**අසත්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ක්‍රියා කිරීම**

යම් පුද්ගලයකු විසින් 2002 අංක 24 දරණ සුභසාධක ප්‍රතිලාභ පනතේ 7 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ ලබා දෙනු ලබන ප්‍රකාශනයක හෝ 7 වන වගන්තියේ (1) වන උපවගන්තිය ප්‍රකාරව සපයනු ලබන තොරතුරු සම්පූර්ණයෙන්ම හෝ කොටසක් අසත්‍ය බවට අනාවරනය වුවහොත් ඒ සම්බන්ධයෙන් එම පනතේ 14 වගන්තිය ප්‍රකාරව ගතයුතු පියවර සම්බන්ධයෙන් පහත උපදෙස් නිකුත් කරමි.

01. මේ අනුව සුභසාධක ප්‍රතිලාභ අපේක්ෂාවෙන් මූලික අයදුම්පතක් ඉදිරිපත් කිරීමේදී හෝ එම අයදුම්පත්වලට අදාලව සංශෝධනය කිරීමේදී හෝ යම් අයදුම්කරුවකු විසින් අසත්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බවට යම් තොරතුරක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලැබුනහොත් හෝ එම කාර්යාල මඟින් සිදුකරනු ලබන යම් සොයාබැලීමක ප්‍රතිඵලයක් වශයෙන් අනාවරණය වුවහොත් ඒ සම්බන්ධයෙන් අදාල දිස්ත්‍රික් ලේකම්/අතිරේක සුභසාධක ප්‍රතිලාභ කොමසාරිස්ගේ අවධානයට එම කරුණ යොමු කළ යුතුයි.

02. අදාල දිස්ත්‍රික් ලේකම්/ අතිරේක සුභසාධක ප්‍රතිලාභ කොමසාරිස් විසින් එම තොරතුරු සම්බන්ධයෙන් යම් නිලධාරියකු හෝ නිලධාරී කණ්ඩායමක් යොදවා පරීක්ෂණයක් සිදු කල යුටුතුයි. එම පරීක්ෂණ මඟින් පහත සඳහන් කරුණු පිළිබඳව අනාවරණය කර ගත යුතුයි.

I. අදාල තැනැත්තා විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු අසත්‍ය තොරතුරු ද යන්න.
II. එම තොරතුරු එම තැනැත්තා විසින්ම හිතාමතාම ඉදිරිපත් කර තිබේද යන්න.
එම පරීක්ෂණයේදී අදාල කරගත් ලිඛිත ප්‍රකාශ, සටහන්, නිර්දේශ, සහායක ලියවිලි ආදිය ඇතුලත් වාර්තා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තබාගත යුතුයි.
III. එම පරීක්ෂණයේ ප්‍රතිඵල මත දිස්ත්‍රික් ලේකම්/අතිරේක සුභසාධක ප්‍රතිලාභ කොමසාරිස් විසින් සිය නිර්දේශ සහිතව වාර්තාවක් මා වෙත එවිය යුතුයි. එම වාර්තාවේ පහත සඳහන් කරුණුද අඩංගු කළ යුතුයි.

- අදාල තැනැත්තා/පවුල යම් ප්‍රතිලාභයක් සඳහා තෝරා ගෙන තිබේ නම් එම ප්‍රතිලාභ කාණ්ඩය හා HH අංකය.
- සපයා ඇති අසත්‍ය තොරතුරු පිළිබඳ විස්තර.
- දිස්ත්‍රික් ලේකම්/ අතිරේක සුභසාධක ප්‍රතිලාභ කොමසාරිස්ගේ නිර්දේශය.

කාර්යාලය / அலுவலகம் / Office: Tel: 009411-2151481, 009411-2484600/4117, Fax: 009411-2151482
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / e-mail: welfarebenefitboard2016@gmail.com, info@iwms.wbb.gov.lk
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.wbb.gov.lk

Scanned with CamScanner

IV. මෙම වාර්තාව පරීක්ෂා කිරීමෙන් අනතුරුව මා විසින් ඒ පිළිබඳව සෑහීමකට පත්වන්නේ නම් සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයට ඉදිරිපත් කර ගනුලබන තීරණය මත අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ. ඒ අනුව එම තැනැත්තා යම් ප්‍රතිලාභයක් සඳහා තෝරා ගෙන තිබේනම් එම තෝරා ගැනීම අවලංගු කිරීම, ප්‍රතිලාභ ගෙවීම අත්හිටුවීම, ගෙවූ ප්‍රතිලාභ ආපසු අය කර ගැනීම, අදාල තීරණය එම තැනැත්තාට දැන්වීම ආදී පියවර සම්බන්ධයෙන් උපදෙස් අදාල අවස්ථාවේදී නිකුත් කිරීමට පියවර ගනු ලැබේ.

මෙම උපදෙස් අනුගමනය කරමින් අසත්‍ය තොරතුරු මත සුදුසුකම් ලබා ඇති පුද්ගලයින් සම්බන්ධයෙන් පියවර ගැනීම සඳහා තොරතුරු අනාවරණය කර ගැනීමට යම් විශේෂ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන ලෙසත් එවැනි පරීක්ෂණ කටයුතු සඳහා සුදුසු වැඩපිළිවෙලක් යොදා ගන්නා ලෙසත් වැඩිදුරටත් උපදෙස් දෙමි.

ජයන්ත විජේරත්න
සභාපති/ කොමසාරිස්

පිටපත්:

01. ලේකම්, මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස.
02. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස.

Scanned with CamScanner